ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/13/AD/1 (V5) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.01. 01 |

චක්‍රලේඛ අංක - **01 / 2020**

සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය /සහකාර කොමසාරිස්වරුන්,

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්

හා කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් වෙත,

**2016/2019 කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ප්‍රතිශෝධන වැඩසටහන යටතේ "B" බාණ්ඩයට යටතේ වර්ගීකරණය කර ඇති පුරන් කුඹුරුවල පරිසර හානියක් ඇති නොවන පරිදි 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන)පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30 (3) හා 34 (1) වගන්ති යටතේ වී හැර අර්ධ වාර්ෂික බෝග හෝ ස්ථිර බෝග නොවන බහු වාර්ෂික බෝග වගා කිරීම හෝ කෘෂිකාර්මික වගාවන් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා හෝ කෘෂිකර්මයට අදාළ වෙනත් කටයුතු සඳහා යොදා ගැනීමට අවසර ලබා දීම තුළින් කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම**

ඉහත කාරණය සම්බන්ධයෙන් 2018/08/27 දාතමින් නිකුත් කරන ලද 19/2018 චක්‍රලේඛය පරිදි යම් පුරන් කුඹුරක් වී වගාව හැර වෙනත් කෘෂිකාර්මික වගාවක් හෝ කෘෂිකාර්මික වගාවක් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුත්තක් සඳහා හෝ කෘෂිකර්මයට අදාළ වෙනත් කටයුතු සඳහා යොදා ගැනීමට මේ වන විටත් අවසර ලබා ගෙන ඇති ඉඩම් හිමියන්, ඉඩම් හිමි ගොවීන් හා බුක්තිකරුවන්ගේ අයිතිවාසිකම්වලට අගතියක් නොවන පරිදි, මෙරටේ පුරන් කුඹුරුවල ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණු ඇතිව පහත සඳහන් චක්‍ර ලේඛ උපදෙස් ක්‍රියාවට නංවන ලෙස මෙයින් උපදෙස් දෙමි.

02. මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාවට නැංවීමේදී කුඹුරු ඉඩම්වලින් ලබා ගත හැකි පාරිසරික වාසි වලට බාධාවක් නොවිය යුතු අතර, එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

I. මෙම චක්‍රලේඛ උපදෙස් අදාළ කරගත යුත්තේ 2016/2019 කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ප්‍රතිශෝධන වැඩසටහනේ 'B' කාණ්ඩය යටතට මේ වන විටත් හඳුනාගෙන ඇති පුරන් කුඹුරු සම්බන්ධයෙන් පමණි. වර්තමානයේ පවතින තත්වය අනුව මෙම ඉඩම්වල වී වගාව සාර්ථකව සිදු කළ නොහැකි අතර, ඒ වෙනුවට ස්ථිර නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමේ හැකියාව පවතී. එසේ වුව ද මෙම ඉඩම්වල නැවත වී වගා කිරීම සඳහා සුදුසු වාතාවරණයක් අනාගතයේදී නිර්මාණය වුව හොත්, එම ඉඩම්වල නැවත වී වගාව සිදු කිරීමට ඉඩකඩ සැලසෙන පරිදි, අදාල ඉඩම් කෘෂිකාර්මික ඉඩම්(කුඹුරු) ලේඛනයේ තව දුරටත් පවත්වාගැනීමටත්, එම ලේඛනයේ "සටහන් තීරුවේ " මෙම චක්‍ර ලේඛය යටතේ අදාල ඉඩම සම්බන්ධයෙන් ලබා දී ඇති අනුමැතිය පිළිබඳ තොරතුරු සටහන් කිරීමට අදාල ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්වරයා ක්‍රියා කළ යුතුවේ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ.பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, No. 42, SIR MARCUS FERNANDO MAWATHA, P. O. BOX. 537, COLOMBO 07.
*දුරකථන/தொலைபேசி/Telephones :*

පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 2694231, 2694232, 2694233, 2694234

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 2691060

ෆැක්ස් / தொலை நகல் / Fax: 2693572, 2691843, 2674481

E-mail : commissionerdad@yahoo.com

විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

II. වී හැර වෙනත් බෝග වගා නොකළ යුතු බවට මේ වන විටත් යම් රාජ්‍ය ආයතනයක් විසින් නිර්දේශ කර ඇති ප්‍රදේශවල පිහිටි පුරන් කුඹුරු සඳහා මෙම චක්‍ර ලේඛයේ උපදෙස් අදාල කර නොගත යුතුය. උදාහරණ ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ( SLLDC) විසින් එම ආයතනයේ පාලනයට යටත් කර ඇති විශේෂ බල ප්‍රදේශ සඳහන් කළ යුතුය. එවැනි විශේෂ බල ප්‍රදේශයන් තුළ පුරන් කුඹුරුවල වී හැර වෙනත් බෝග වගාවන් සඳහා අවසර ලබා දීමේදී, අදාල ආයතනයේ පූර්ව අවසරය ලබා ගත යුතු වේ.

III. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ හෝ වාරිමාර්ග ආඥාපනත යටතේ වගාකන්න රැස්වීම් පැවැත්වෙන කුඹුරු ඉඩම් වලට අදාල පුරන් කුඹුරු සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා ගොවිජන සංවර්ධන පනතේ 86 (1) වගන්තිය යටතේ පැවැත්වෙන “ ඉඩම්හිමි ගොවීන් හා බුක්තිකරුවන්ගේ නීත්‍යානුකූල රැස්වීමක්” හෝ 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 5(6) වගන්තිය යටතේ පැවැත්වෙන නීත්‍යානුකූල වගා කන්න රැස්වීමකදී මේ සඳහා යෝජනා ස්ථිරතාවයෙන් එකඟතාවය ලබා ගත යුතු අතර, එම රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපතක් අදාල ගොවිජන සේවා කාරක සභාවේ, මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමට අදාල ලිපිගොනුවට ඇමිනිය යුතුය. එසේම කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ලේඛනයේ, මෙම චක්‍රලේඛය යටතේ අවසරය ලබා දෙන කුඹුරු ඉඩමට අදාළ “යොමුව” මගින් යොමු කරනු ලබන “සටහන් තීරයේ”, ඉහත සඳහන් වගා කන්න රැස්වීම් අනුමැතිය පිළිබඳව සටහනක් තැබිය යුතු වේ.

IV. මෙම චක්‍රලේඛය නිකුත් කළ දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඉහත උපදෙස් වලට අදාළ "B" වර්ගයේ පුරන් කුඹුරු වී වගාව හැර පහත සඳහන් භාවිත සඳහා යොදා ගැනීමට, අදාල ඉඩම් හිමියන්, ඉඩම් හිමි ගොවීන් හා බුක්තිකරුවන්ට අවසර හිමිවනු ඇත.

(අ) අර්ධ වාර්ෂික බෝග

(ආ) ස්ථිර නොවන බහුවාර්ෂික බෝග

(ඇ) වගා කිරිම හැර වෙනත් කෘෂිකාර්මික කටයුතු

<u>අර්ධවාර්ෂික බෝග සඳහා උදාහරණ</u>

I. එදිනෙදා පරිභෝජනය කළ හැකි එළවළු වර්ග වගා කිරීම

II. කංකුං.මුකුණුවැන්න, ගොටු කොළ, සාරණ, අසමෝදගම්, නිවිති වැනි ආහාරයට ගනු ලබන පළා වර්ග, දුර්වල ජලාපවහනයක් ඇති පහත් බිම්වල කොහිල, නෙලුම් දඬු,කෙකටිය, කැරන්කොකු, නිරමුල්ලිය වැනි වගාවන් සිදු කිරීම.

III. සුදුසු කුඹුරු ඉඩම්වල දැනට දුර්ලභව පවතින ලංකාවටම ආවේනික අල වර්ග වන කඳල,දංදාල, කිරි අල, වැල් අල, කුකුල් අල, ජා අල, මඤ්ඤොක්කා යනාදිය වගා කිරිම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.

IV. කහ, ඉඟුරු වැනි බෝග වගා කිරීම.

V. කිරි එළදෙනුන් සඳහා අවශ්‍ය වන තෘණ වර්ග වගා කිරීම.

VI. මනා ජල වහනයක් ඇති ඉඩම්වල බඩ ඉරිඟු,මිරිස්,රට කජු වැනි අතිරේක බෝග වගා කිරීම.

VII. එක් බෝගයක් වෙනුවට කෙටි කාලීන මිශ්‍ර බෝග හෝ අතුරු බෝග ( Mix Cropping Inter Cropping) හඳුන්වා දීමට ඉඩකඩ සලසා දීම.

මේ යටතේ ඉහත සඳහන් බෝග වලට අමතරව ප්‍රදේශයට ගැලපෙන බෝග වර්ග කෘෂිකර්ම උපදේශකවරයාගේ නිර්දේශ මත හඳුන්වා දීමට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් හා කෘ.ප.නි.ස. වරුන් ක්‍රියාකල යුතුය.

<u>ස්ථිර නොවන බහු වාර්ෂික බෝග</u>

මෙහිදී බෝගයේ ආයු කාලය වසර 5 නොඉක්මවන ස්ථිර නොවන බෝග ලෙස කෙසෙල්, ගස් ලබු,අන්නාසි, ඩ්‍රැගන් ෆෲට් වෙනත් පළතුරු ආදිය අදහස් කෙරේ.මෙහිදී කුරුඳු,කුලු බඩු ආදි වසර 5කට වඩා වැඩි බහුවාර්ෂික බෝග වගා කිරීමට අපේක්ෂා කරයි නම්, ඒ සඳහා 19/2018 චක්‍රලේඛයේ 6 (4) යටතේ අනුමැතිය ලබා ගැනීමට ඉඩම් හිමියන් විසින් ක්‍රියා කල යුතුය.

<u>බෝග වගාවන් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු</u> ලෙස මී මැසි පාලනය, මිරිදිය මත්ස්‍ය කර්මාන්ත, බිම්මල්, පැල හා පළතුරු තවාන්, සත්ව පාලනය ආදිය අයත් වේ.එහෙත් ස්ථිර වූ මිරිදිය මත්ස්‍ය පොකුණු ඉදි කිරීමට අපේක්ෂා කරන අවස්ථාවලදී 19/2018 චක්‍රලේඛයේ ඒ සම්බන්ධයෙන් වූ උපදෙස් පිළිපැදිය යුතු වේ.

එසේම කෘෂිකාර්මික කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා සහය වන පහත සඳහන් කරුණු සඳහාද මේ යටතේ අවසර හිමි වේ.

I. කුඩා ප්‍රමාණයේ පොකුණු , පතස්, ගොඩ වලවල් ආදී වැසි ජලය රැස් කිරීම සඳහා මෙන්ම රොන්මඩ,යකඩමල සහිත ජලය පෙරා වෙන් කිරීමට අවශ්‍ය පහසුකම සැලසීම සඳහා යොදා ගැනීම.

II. පැල තවාන් පවත්වා ගැනීම, තාවකාලික ආරක්ෂිත ගෘහ, මල් පැල වගා කිරීම ආදිය සඳහා පුරන් වූ කුඹුරු ඉඩම් යොදා ගැනීම.

III. ස්වභාවික හෝ කෘත්‍රිම ජල මාර්ග, ජල උල්පත්, වාරිමාර්ග නිර්මිත, කෘෂි මාවත් ආදිය සඳහා අවශ්‍ය රක්ෂිත වෙන් කිරීම.

මෙම චක්‍රලේඛයේ අවසරය යටතේ අපේක්ෂිත වගාවන්ට සරිලන පරිදි බිම් සැකසීම හෝ පාත්ති සැකසීම සිදු කළ හැකි වුවද, මොනම හේතුවක් නිසාවත් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අවසරයකින් තොරව ඉඩමට පිටතින් රැගෙනවිත් පස් පිරවීම හෝ ඉඩමින් පස් ඉවත් කිරීම හෝ අදාල ඉඩමේ කිසිදු ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථිර නිර්මිත ඉදි කිරීම සිදු නොකල යුතුය.එහෙත් යෝජිත කෘෂිකාර්මික කටයුත්ත සාර්ථකව ඉටුකිරීම සඳහා අත්‍යාවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා අදාල පුරන් කුඹුරේ "තාවකාලික මඩු" ඉදිකිරීමට අවසර හිමිවේ.

මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අදාල වන "B" වර්ගයේ පුරන් කුඹුරු ඉඩම් වල වී හැර අර්ධ වාර්ෂික බෝග, ස්ථිර නොවන බහු වාර්ෂික බෝග මෙන්ම වගාවන් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම සඳහා වන අවසර පත්‍රය, ඇමුණුම -1 ආකෘතියට අනුව පිළියෙල කොට 2020.02.15 දිනට පෙර අදාල ඉඩමේ ඉඩම්හිමි ගොවියා වෙත හෝ භුක්තිකරුවකු සිටින ඉඩමක් නම් එම ඉඩමේ ඉඩම්හිමියා වෙත හා බුක්තිකරුවෙත බාර දීමට සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් ක්‍රියා කළ යුතුය.

මෙසේ අවසරපත්‍ර ලබා ගනු ලබන "B" වර්ගයේ පුරන් කුඹුරු, කට්ටිමාරු හෝ තට්ටුමාරු ක්‍රමයට වගාකරනු ලැබූ කුඹුරු ඉඩම් යටතට ගැනේ නම්, ඒවායේ අර්ධවාර්ෂික බෝග වගා කිරීම සිදු කළ යුතු අතර, ස්ථිර නොවන බහු වාර්ෂික බෝග හෝ වගාවන් නොවන කෘෂිකාර්මික කටයුතු සඳහා එම ඉඩම යොදාගන්නේ නම්, අදාල ඉඩමේ සියළුම ඉඩම් හිමි ගොවීන්ගේ හෝ බුක්තිකරුවන් සිටින අවස්ථාවේදී සියළුම ඉඩම්හිමියන්ගේ හා බුක්තිකරුවන්ගේ පොදු එකඟතාවය ඇතිව "සාමූහික ගොවිපල ක්‍රමයක්" ක්‍රියාත්මක කළ යුතු වේ.

මෙම චක්‍රලේඛය යටතේ වී හැර වෙනත් ස්ථිර නොවන බෝග වගාව සඳහා අවසර ලබා ගනු ලබන "B" වර්ගයේ පුරන් කුඹුරු ඉඩමක අඳ ගොවියකු සිටින අවස්ථාවේදී, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 35 (1) වගන්තිය යටතේ අඳ ගොවියා විසින් ඉඩම් හිමියා වෙත ගෙවිය යුතු බද්ද නිශ්චය කිරීමේදී 2019 මාර්තු මස 12 වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2114/11 දරණ සාමාන්‍ය ගැසට් නිවේදනයේ සඳහන් උපලේඛණයේ 11 වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති බදු මුදල් යොදාගත යුතුය.එසේම එම ගැසට් නිවේදනයේ උප ලේඛණයේ 1 වන තීරුවේ සඳහන් නොමැති කෘෂිකාර්මික බෝග සම්බන්ධයෙන් ඉඩම් හිමියා වෙත අඳ ගොවියා විසින් ගෙවිය යුතු බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් නිවේදනයක් මඟින් ඉදිරියේදී ප්‍රකාශයට පත්කරන අතර, මෙහිදී ගෙවිය යුතු බදු මුදල් සම්බන්ධයෙන් ඉඩම්හිමියා හා බුක්තිකරු අතර අන්නෝන්‍ය එකඟතාවයෙන් යුක්තව ක්‍රියා කිරීමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවන්නේය.

2016-2019 කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ලේඛන ප්‍රතිශෝධන වැඩසටහනේදී "B" බාණ්ඩය යටතට වර්ගීකරණය කරන ලද එසේම මෙම චක්‍රලේඛයේ කොන්දේසි අදාල කර ගත යුතු සියලුම පුරන් කුඹුරු සඳහා වන ඇමුණුම -1 අවසර පත්‍රය නිකුත් කිරීමේ බලතල 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30(3) හා 34(1) වගන්ති ප්‍රකාරව අදාල ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත මෙයින් පවරනු ලැබේ.

මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අදාලව නිකුත් කරනු ලබන ඇමුණුම-1 ආකෘතිය ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිශ්පාදන සහකාරවරයා මඟින් අදාල ඉඩමේ ඉඩම්හිමි ගොවියා හෝ බුක්තිකරුවකු සිටින අවස්ථාවේදී ඉඩම් හිමියා හා බුක්තිකරු වෙත ලබා දීමට හා එම සහතිකය අදාල පුද්ගලයා විසින් භාරගත් බවට ලිඛිත සාක්ෂියක් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා ගැනීමට සෑම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරිවරයෙකුම ක්‍රියා කළ යුතු වේ. යම් බල ප්‍රදේශයක කෘ.ප.නි.ස වරයකු සේවය නොකරන අවස්ථාවේදී, ඇමුණුම -1 අවසර පත්‍රය අදාල පුද්ගලයා වෙත භාරදීමේ වගකීම, ප්‍රදේශයේ හඳුනාගත් ගොවි සංවිධාන නියෝජිතයකු වෙත පැවරීමට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් ක්‍රියා කළ යුතුය.

එසේම මෙම අවසර පත්‍රය ලැබී මාස 03ක් ඇතුළත අදාල ඉඩම මෙම චක්‍රලේක උපදෙස් පරිදි ඵලදායි ලෙස යොදා ගැනීමට සූදානම් කර, ඊට අදාල තොරතුරු ඇමුණුම 2 ආකෘතිය මඟින් අදාල ඉඩමේ ඉඩම්හිමි ගොවියා හෝ බුක්තිකරුවෙකු සිටින අවස්ථාවේදී අදාල ඉඩමේ අයිතිකරු හා බුක්තිකරු විසින් ප්‍රදේශයේ කෘ.ප.නි.ස වරයා මඟින් හෝ කෘ.ප.නි.ස වරයකු සේවය නොකරන බල ප්‍රදේශයකනම්, ප්‍රදේශයේ ගොවි සංවිධානය මඟින් ඉඩම පිහිටි ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත බාර දීමට ක්‍රියා කළ යුතුවේ.

එසේම මෙම චක්‍රලේඛයේ උපදෙස් මත "B" වර්ගයේ පුරන් කුඹුරු ඉඩමක් සඳහා නිකුත් කල යුතු සියළුම අවසර පත්‍ර 2020.02.15 දිනට පෙර අදාල පුද්ගලයන් වෙත බාර දී, ඒ බැව් දිස්ත්‍රික්භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා වෙත වාර්තා කිරීමට සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් ක්‍රියා කළ යුතුවේ. එසේම එසේ බලපත්‍ර නිකුත් කරනු ලබන ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අදාලව එම ඉඩම්වල සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හා ඇමුණුම -2 ආකෘතිය ලැබීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත සෑම මසකම පළමු සතිය තුළ වාර්තා කිරීමට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරීන් ක්‍රියා කල යුතුවේ.

එසේම මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඇමුණුම 3 ආකෘතිය අනුව සෑම මසකම පළමුවන සතිය තුළ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් විසින් ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කළ යුතු වේ.

01/2020 චක්‍රලේඛය යටතේ අවසර පත්‍රයක් හිමිනොවන 19/2018 චක්‍රලේඛයේ 6 (4) යටතේ ඉල්ලීම් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන ඕනෑම පුරන් කුඹුරු හිමියෙකුට හෝ බුක්තිකරුවෙකුට 19/2018 චක්‍රලේඛය යටතේ ඉල්ලීම් කිරීමට ඉදිරියටත් හැකියාව ඇති අතර, 19/2018 චක්‍රලේඛය යටතේ වන අවසර පත්‍රයක් සඳහා ඉල්ලීම් කිරීමට යම් තැනැත්තෙකුට ඇති අයිතියට 01/2020 චක්‍රලේඛය බාධාවක් නොවන බවද වැඩි දුරටත් සඳහන් කරමි.

එසේම 01/2020 චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු බව අවධාරණය කරමි.

අ. මොනම හේතුවක් නිසාවත් දැනට සාර්ථකව වී වගා කරන හෝ සාර්ථකව වී වගා කළ හැකි කුඹුරු ඉඩම්වල වෙනත් බෝග වගාවන් සඳහා අවසර ලබා දීමට මෙම චක්‍රලේඛය යොදා නොගත යුතුව.

ආ. 2017/2019 කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ප්‍රතිශෝධන වැඩසටහනේ "B" භාණ්ඩය යටතට වර්ගීකරණය කර ඇති පුරන් කුඹුරු හැර වෙනත් කුඹුරු ඉඩම් සඳහා අවසර පත්‍ර ලබා දීමට මෙම චක්‍රලේඛය යොදා ගැනීම බරපතල විනය විරෝධී කටයුත්තක් ලෙස සලකනු ඇත.

මහවැලි විශේෂ බල ප්‍රදේශ වල ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව මහවැලි සංවර්දන අධිකාරිය විසින් සිදු කරනු ලබන බැවින්, මෙම චක්‍රලේඛ උපදෙස් මහවැලි බල ප්‍රදේශ සඳහා අදාල නොවනු ඇත.

මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක වීමත් සමඟම ශ්‍රීලංකාව තුළ පිහිටා ඇති "B" වර්ගයේ පුරන් කුඹුරු ඵලදායී ලෙස යොදා ගැනීමට ක්‍රියාශීලීව කටයුතු සංවිධානය කිරීම, ගොවි සංවිධාන, වසමභාර කෘ.ප.නි.ස වරුන්, ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරීන් හා දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්ගේ වගකීම වන්නේය.

එසේම මෙම චක්‍රලේඛ උපදෙස් දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක වලට අදාල කරගත යුතු අතර, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30(3) හා 34(1) වගන්ති යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයා සතු බලතල මෙම දෙපාර්තමේන්තුවේ විවිධ තලවල නිලධාරීන් සඳහා පවරා දෙනු ලැබුව ද, අවශ්‍යයැයි හැඟෙන ඕනෑම අවස්ථාවක, ගොවිජන සංවර්ධන කොමසාරිස්ජනරාල්වරයාට එම බලතල සෘජුවම ක්‍රියාවට නැංවීමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවන බව ද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
2. සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත
3. අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
5. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
6. සභාපති, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
7. සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත
8. සියළුම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂකවරුන් වෙත
9. සියළුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
10. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිළධාරීන් වෙත

ඇමුණුම - 01

# අවසර පත්‍රය

2016/19 කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ප්‍රතිශෝධන වැඩසටහනින් "B" වර්ගය යටතේ හඳුනාගෙන ඇති පහත සඳහන් පුරන් කුඹුර, පරිසර හානියක් ඇති නොවන පරිදි 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30 (3) හා 34 (1) වගන්ති යටතේ වී හැර වෙනත් අර්ධ වාර්ෂික බෝග හෝ ස්ථිර නොවන බහු වාර්ෂික බෝග වගා කිරීම හෝ කෘෂිකාර්මික වගාවන් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා හෝ කෘෂිකර්මයට අදාල 01/2020 චක්‍රලේඛයේ සඳහන් වෙනත් කටයුතු සඳහා යොදා ගැනීමට එම චක්‍රලේඛයෙන් මා වෙත පැවරී ඇති බලතල හා උපදෙස් මත මෙයින් අවසර ලබා දෙමි.

1. ඉඩමේ නම :-

2.පිහිටීම
- 2.1 දිස්ත්‍රික්කය :-
- 2.2 ගොවිජන සේවා බල ප්‍රදේශය :-
- 2.3 ප්‍රා.ලේ. කොට්ඨාශය :-
- 2.4 යාය :-
- 2.5 හඳුනා ගැනීමේ අංකය :-

3. ජල ප්‍රභවය :- මහා වාරි ☐ මධ්‍යවාරි ☐ සුලුවාරි ☐ අහස් දිය ☐

4. මායිම් :- උ -

නැ -

දු -

බ -

5. බිම් ප්‍රමාණය :- අ. රූ. ප.

6. අයිතිය හා බුක්තිය

6.1 ඉඩම් හිමිගොවියාගේ නම :
බුක්තිකරුවකු සිටී නම්

6.2 ඉඩම් හිමියාගේ නම :

6.3 අඳ ගොවියා/හවුල් අඳ ගොවියා/ බද්දකරුගේ නම :

( ඉඩම් හිමි ගොවීන්, ඉඩම්හිමියන්, බුක්තිකරුවන් එක් අයකුට වඩා සිටිනම්, එම සියළුදෙනාගේම නම් සඳහන් කරන්න)

මෙම අවසර පත්‍රය ලැබී මාස 03ක් ඇතුළත අදාල ඉඩම ඉහත සඳහන් පරමාර්ථ සඳහා 01/2020 චක්‍රලේඛයේ උපදෙස් පරිදි යොදා ගැනීමට සූදානම් කොට ඒ බව ඇමුණුම - 02 ආකෘතියට අනුව ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා මඟින් ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත යොමු කළ යුතු වේ. කෘ.ප.නි.ස වරයකු සේවය නොකරන බල ප්‍රදේශ වල ඊට අදාල නිර්දේශය අදාල ගොවි සංවිධානයේ සභාපති හා ලේකම් වෙතින් ලබා ගත යුතුය.

කොන්දේසි

I. ඉහත ඉඩමේ වී නොවන එසේම ස්ථිර නොවන වෙනත් බෝග වගා කිරීමේදී හෝ වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමේදී පරිසරයට හානි සිදු නොවන පරිදි ක්‍රියා කල යුතුය.

II. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අවසරයකින් තොරව ඉහත ඉඩමට පස් පිරවීම, ඉඩමෙන් පස් ඉවත් කිරීම මෙන්ම ඉඩමේ ස්ථිර ගොඩනැගිලි හෝ වෙනත් නිර්මිත ඉදි කිරීම සිදු නොකළ යුතුය.

III. යාබද ඉඩම්වල වාරිමාර්ග හෝ ජලාපවාහන පද්ධතිවලට බාධා නොකළ යුතු අතර, ජල මූලාශ්‍රවලට හානි සිදුවන කිසිදු ක්‍රියාවක් සිදු නොකළ යුතුය.

ඉහත සඳහන් කොන්දේසි කඩ කිරීමක් සිදු වුව හොත් මෙම බල පත්‍රය අවලංගු කිරීමට මෙන්ම ගොවිජන සංවර්ධන පනතේ විදිවිධාන ප්‍රකාරව ඔබට විරුද්ධව නීත්‍යානුකූලව ක්‍රියා කිරීමට සිදුවන බව ද වැඩි දුරටත් දැනුම් දෙමි.

එසේම, දීර්ඝ කාලයක් පුරන්ව පැවති මෙම කුඹුරු ඉඩම, එම ඉඩමෙන් ලැබෙන පාරිසරික වාසි වලට බාධා නොවන පරිදි ඵලදායී ලෙස යොදා ගැනීමට මෙම අවසර පත්‍රයෙන් ලැබී ඇති අනුමැතිය ඔබ විසින් ප්‍රයෝජනයට ගනු ඇතැයි විශ්වාස කරමි.

.....................................................

දිනය:-

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙනුවට
(නිල මුද්‍රාව)

පිටපත්:

1. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්
........................... දිස්ත්‍රික්කය

ඇමුණුම - 02

**"B" වර්ගයේ පුරන් කුඹුරුවල වී හැර අර්ධ වාර්ෂික බෝග හෝ ස්ථිර නොවන බහුවාර්ෂික බෝග හෝ වගාවක් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු හෝ කෘෂිකර්මයට අදාල වෙනත් කටයුතු හෝ සිදුකිරීම වාර්තා කිරීම**

2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30(3) හා 34(1) වගන්ති යටතේ නිකුත් කරන ලද 01/2020 දරණ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ උපදෙස් පරිදි මා හට / අපහට අයත් පහත සඳහන් ඉඩමේ, මේ වන විට වී වගාව නොවන එමෙන්ම ස්ථිර වගාවක් නොවන පහත සඳහන් කෘෂිකාර්මික කටයුත්ත සඳහා සූදානම්කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඉඩමේ නම :
පිහිටීම : දිස්ත්‍රික්කය :
ගොවිජන සේවා මධ්‍යස්ථානය :
ග්‍රාම නිලධාරි කොට්ඨාශය :
යාය :
හඳුනාගැනීමේ අංකය :

මෙම පුරන් කුඹුර යොදා ගැනීමට සූදානම්කර ඇති කාරණය

| කාරණය (බෝගය හෝ කාරණය සඳහන් කරන්න) | බිම් ප්‍රමාණය | | |
|---|---|---|---|
| | අක් | රූඩ් | පර් |
| I | | | |
| II | | | |
| III | | | |
| එකතුව | | | |

.............................
ඉඩම් හිමි ගොවියා (අත්සන)
නම:

හෝ (අඳ ගොවියකු හෝ බද්දකරුවකු සිටී නම්)

.............................
ඉඩම් හිමියා (අත්සන)
නම:
දිනය:

.............................
අඳකරු/බද්දකරු (අත්සන)
නම:
දිනය:

( කෘ.ප.නි.ස. වරයාගේ හෝ ගොවි සංවිධානයේ නිර්දේශය)

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

දිනය

.............................
කෘ.ප.නි.ස වරයාගේ අත්සන
නිල මුද්‍රාව

හෝ (කෘ.ප.නි.ස. වරයකු සේවය නොකරන බල ප්‍රදේශ සඳහා)

දිනය:

.............................
සභාපති (අත්සන)
ගොවි සංවිධාන නිල මුද්‍රාව

.............................
ලේකම් (අත්සන)

ඇමුණුම -3

## 01/2020 චක්‍රලේඛය යටතේ "අවසර පත්‍ර " නිකුත් කිරීමේ ප්‍රගතිය වාර්තා කිරීම

(2020.   .   දිනය)

දිස්ත්‍රික්කය :-

| අනු අ. | ගොවිජන සේවා මධ්‍යස්ථානය | "B" භාණ්ඩය යටතේ හඳුනාගෙන ඇති | | ආකෘති- 1 "අවසර පත්‍ර" නිකුත් කර ඇති | | ආකෘතිය -2 ලැබී ඇති | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | ඉඩම් කැබලි සංඛ්‍යාව | අක්කර ගණන | ඉඩම් කැබලි සංඛ්‍යාව | අක්කර ගණන | ඉඩම් කැබලි සංඛ්‍යාව | අක්කර ගණන | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.

දිනය :-

.............................................................................................

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්

............................................ දිස්ත්‍රික්කය